**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 14 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| 1.6.1(අ) | චක්‍රලේඛයේ 7(V) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම් ගණනය කරන ආකාරය දක්වා තිබුණද ඒ අනුව ගණනය නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් මුළු වගකීම අතර රු.299,675 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද වැය විෂයයන් 10 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.32,428,000 න් රු.9,175,000 ක් එනම් සියයට 28 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. වැය විෂයන් අතර මාරු කිරීමේ ප්‍රතිශතය සියයට 1 සිට සියයට 100 දක්වා වී තිබුණි. | 2020 වර්ෂයේ ඒ ඒ වැය විෂයයන් වෙත ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අත්‍යාවශ්‍යම වියදම් පියවාගැනීම සඳහා අතිරික්තයක් පෙන්නුම් කරනලද වැය විෂයයන් මඟින් ප්‍රතිපාදන මාරුකර ලබාගැනීමට කටයුතු කරන ලද අතර COVID 19 වසංගත තත්ත්වය හමුවේ අනපේක්ෂිත වියදම් දැරීමට සිදුවීම මත ඇස්තමේන්තු කළ පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට හැකියාවක් නොවූ බැවින් දේශීය හා විදේශීය සංචාරයන් සහ පාඨමාලාවන් සීමාකිරීම හේතුවෙන් 325-01-1-2401 වැය විෂයෙහි විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිවූ බැවින් එම ප්‍රතිපාදන වෙනත් ප්‍රාග්ධන වැය විෂයයන් වෙත මාරු කරන ලදී. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සමාලෝචිත වර්ෂය සඳහා ගෙවීමට තිබූ රු.1,522,321 ක් වූ වියදම් බැරකම් ලෙස දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂයේදී කරන ලද ගෙවීම් අතරින් විගණන විමසුම මගින් පෙන්වාදී ඇති බිල්පත් ගිණුම් අංශය වෙත ලැබෙන විටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ බැවින් එම බිල්පත් බැරකම් ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකි වූ අතර එම ආයතන හා සම්බන්ධීකරණය වී කඩිනමින් අවශ්‍ය බිල්පත් ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදුන් අතර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රථම නැවත පසුවිපරම් සිදුකර බැරකම් ලේඛණය පිළියෙළ කිරීම සඳහා ගණකාධිකාරී හා එහි කාර්යමණ්ඩලය වෙත අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. | බැරකම් නිවැරදිව දැක්විය යුතුය. |
| **(iii)** | බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්මවීම තුළද පුනරාවර්ථන වැය විෂයයන් 05 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන නොලැබීම සහ අතුරු සම්මත ගිණුම් මගින් ප්‍රතිපාදන ලබාදීම මත නිසි පරිදි බැරකම්වලට එළඹීමට අපහසු වුවද දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සහ **COVID -** 19 වසංගත තත්ත්වය හමුවේ වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ ජීවිත ආරක්ෂා කිරීමටත් ඒ සඳහා අත්‍යාවශ්‍ය වියදම් පියවා ගැනීමටත් ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹී ඇති බව හා ඉදිරි වර්ෂයන්හිදී අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹීමෙන් වැළකී සිටීමට කටයුතු කෙරේ. | ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹිය යුතුය. |
| **(iv)** | වැය ශීර්ෂ තුළ ප්‍රතිපාදන ඉතිරි වී තිබියදී ඊට හේතු ලෙස ඉල්ලුම් කළ පරිදි අක් මුදල් නොලැබීම ලෙස දක්වා තිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් අතුරු සම්මත ගිණුම් මගින් ප්‍රතිපාදන වෙන් කරන ලද අතර, ඒ ඒ කාලසීමාවන්හිදී වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පැවති බිල්පත් නිරවුල් කිරීම සඳහා අක් මුදල් ඉල්ලුම් කළද අක් මුදල් නිසි පරිදි නොලැබීම මත ගෙවීම් කිරීමද ප්‍රමාද වූ බැවින් සැපයුම්කරුවන් විෂයයන් සැපයීමටද හැකියාවක් නොමැති බව දන්වා සිටින ලද අතර ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමත සැපයුම්කරුවන් වැඩි පිරිසක් කොළඹ | ඉතිරිවීම්වලට හේතු දැක්වීමේදී දැඩි පරීක්ෂාවකින් යුතුව හේතු දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රදේශය හා ඒ අවට වන බැවින් COVID - 19 වසංගත තත්ත්වය හමුවේ ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථාන දීර්ඝ කාලීනව වසා දැමීම හේතුවෙන් විෂයයන් නියමිත දිනයන්හිදී ලබා ගැනීමටද නොහැකි වීම මත වෙන් කරන ලද ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට නොහැකි වීම සහ වර්ෂය අවසානයේදී ඉල්ලුම් කළ පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකිව බිල්පත් ඉතිරි වීම හේතුවෙන් වැය විෂයයන්හි ප්‍රතිපාදන අතිරික්තයක් සිදුවිය. | |
| **(v)** | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය වත්කම් අත්පත් කර ගැනීම සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයේ රු.4,480,000 න් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,310,904 ක් හෙවත් සියයට 29 ක් ඉතිරි වී තිබුණි. | අවශ්‍ය විෂයයන් මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය යටතේ ක්‍රියා කොට සැපයුම්කරුවන් වෙත ප්‍රතිපාදන නොඉක්මවන පරිදි ඇණවුම්පත් ඉදිරිපත් කළද වසර පුරාම පැවති COVID - 19 වසංගත තත්ත්වය හමුවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිසැල් විශාල ප්‍රමාණයක් වසා තිබූ බැවින් හා පරිඝණක සහ මුද්‍රණ යන්ත්‍ර ආනයනය කිරීම අඩපණවීම මත ඉල්ලුම් කරන ලද විෂයයන් සැපයුම්කරුවන් විසින් සැපයීමට අපොහොසත්වීම හේතුවෙන් 325-1-01-2102 ගෘහ භාණ්ඩ හා කර්යාලීය වත්කම් වැය විෂයයෙහි ප්‍රතිපාදන ඉතිරියක් සිදුවිය. | ප්‍රතිපාදන උපරිමයෙන් පාවිච්චි කිරීමට කටයුතු කළ යුතුය. |
| **(vi)** | ගිවිසුම්ගත සේවාවන් සහ කාර්යාලීය අවශ්‍යතා මනා පාලනයකින් යුතුව පවත්වා ගැනීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වුවද පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,471,885 ක් හෙවත් සියයට 9 ඉක්මවා තිබුණි. | 325-1-01-1201 ලිපිද්‍රව්‍ය හා කයීාලීය අවශ්‍යතා යටතේ අත්‍යාවශ්‍ය විෂයයන් මිළදීගත් නමුත් පෙර වර්ෂයන්ට වඩා සාපේක්ෂ වශයෙන් මිළ ගණන් ඉහළයාමත් COVID - 19 වසංගත තත්ත්වය හමුවේ වෙරළ ආරක්ෂක පුද්ගලයින් වැඩි ප්‍රමාණයක් කඳවුර තුළ රැඳී සිටීමත් නිවාඩු ගොස් පැමිණෙන වෙරළ ආරක්ෂක පුද්ගලයින් සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත කඳවුර අවට නිරෝධායන මධ්‍යස්ථානයන් ස්ථාපිත කර නිරෝධානයට ලක්කර රාජකාරි සඳහා අනුයුක්ත කරනු ලබන බැවින් ඔවුන්ගේ සනීපාරක්ෂක පහසුකම් සහ එම ස්ථානයන්හි ජල/ විදුලි බිල්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ | ගිවිසුම්ගත සේවාවන් සහ කාර්යාලීය අවශ්‍යතා මනා පාලනයකින් යුතුව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුමැතිය මත ගෙවීම් කිරීම හේතුවෙන් 2020 වර්ෂය තුල විදුලිය හා ජල පරිභෝජනය වැඩිවී ඇති බැවින් 325-1-01-1403 විදුලිය හා ජලය වැය විෂයය යටතේ වියදම් ඉහළ ගොස් ඇත. | |
| **(vii)** | අනුමත වියදම සීමාවන් ඇතුලත තම වියදම් සැලසුම් කර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 ක් සඳහා මූලික ප්‍රතිපාදනයට අමතරව පරිපූරක ඇස්තමේන්තු, මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම මඟින් රු.23,350,000 ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. | වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවට 2020 වර්ෂය වෙනුවෙන් ඒ ඒ වැය විෂයයන් වෙත අවශ්‍ය ප්‍රතිපාදන ඇස්තමේන්තු කර ඉල්ලුම් කළද ප්‍රතිපාදන ඉල්ලුම් කළ පරිදි නොලැබුණු බැවින් දෙපාර්තමේන්තුවේ කටයුතු නිසි පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාමට මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම උදෙසා අත්‍යාවශ්‍යම වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 මගින් ප්‍රතිපාදන මාරුකර ගැනීමට කටයුතු කළ අතර, විදුලිය හා ජලය ඉතාම අරපිරිමැස්මෙන් භාවිතා කළද පැවති COVID - 19 වසංගත තත්ත්වය හමුවේ වැඩි පිරිසක් කඳවුර තුළ රැඳී සිටීමත් නිවාඩු ගොස් පැමිණෙන පුද්ගලයින් නිරෝධායනයට ලක් කිරීම සඳහා නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට සහ එම ස්ථානයන්හි සනීපාරක්‍ෂක පහසුකම් සැපයීමට කටයුතු කිරීමත් මත විදුලිය හා ජල පරිභෝජනය සාපේක්‍ෂ වශයෙන් ඉහළ ගොස් ඇති බවත් දෙපාර්තමේන්තුවේ බිල්පත් සහ නිරෝධායන මධ්‍යස්ථානයන්හි බිල්පත් නිරවුල් කිරීමට එම වැය විෂයය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ආරක්‍ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත අමතර ප්‍රතිපාදන ලබා ගැනීමටත් සිදුවිය. | අනුමත වියදම සීමාවන් ඇතුලත තම වියදම් සැලසුම් කර ගත යුතුය. |
| **(viii)** | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/ 2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 10.1 ඡේදය යටතේ 2020 මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට අදාළ මාර්ගෝපදේශයෙහි 3.2 වගන්තිය ප්‍රකාරව මූල්‍ය | 2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී අතපසුවීමකින් අගය ආසන්න රුපියලට ගණනය කර නොමැති බව හා ඉදිරි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු සිදු කෙරේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආදායම්, වියදම් හා අනෙකුත් ප්‍රධාන ලෙජර් ශේෂයන්හි අගය ආසන්න රුපියලට වාර්තා කල යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| **(ix)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වටිනාකමට ඇතුළත් විය යුතු රු. 162,050 ක දේශීය ගමන් වියදම් වටිනාකම අනෙකුත් භාණ්ඩ හා සේවා ප්‍රතිලාභ යටතේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් අංක 5 ට අදාලව ACA 2 (ii) හි වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ යටතේ 1001, 1002 හා 1003 වැය විෂයයන්ගේ එකතුව දක්වන ලෙසත් එම ප්‍රකාශයේ සටහන අංක 6 ට අදාලව අනෙකුත් භාණ්ඩ හා සේවා යටතේ ඇති ගමන් වියදම් 1101 හා 1102 ඇතුළත් කරන ලෙසත් දන්වා ඇති බැවින් රු.162,050.00ක දේශීය ගමන් වියදම සටහන් අංක 6 යටතේ අනෙකුත් භාණ්ඩ හා සේවා ප්‍රතිලාභ යටතේ දක්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**(ආ)** **දේපල පිරියත හා උපකරණ**

--------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව මූල්‍ය නොවන වත්කම් හි ආරම්භක ශේෂ වටිනාකම රු. 2,049,548,628 ක් විය. එම වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ACA - 06) හි ආරම්භක ශේෂය ලෙස නිවැරදිව නිරූපණය කර තිබුණි. එසේ වුවද ඒසීඒ - පී හි නිරූපිත 2019 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි එම වටිනාකම රු.103,427,526 ක් ලෙස සටහන් කර තිබුණි. | 2019 දෙසැම්බර් මස 31 වන දිනට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විටත් භාණ්ඩාගාර අවසන් වාර්තාවන්හි මූල්‍ය නොවන වත්කම්හි ආරම්භක ශේෂයන් යාවත්කාලීන කර නොමැති බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි පැවති අගයන් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරන ලද අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයවී මූල්‍ය නොවන වත්කම් යාවත්කාලීන කර ගැනීමට කටයුතු කරන ලදී. එබැවින් 2019 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් අගය නිවැරදි නොවන අතර 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශය (ACA-6) හි ආරම්භක ශේෂය වශයෙන් යාවත්කාලීන කරන ලද රු.2,049,548,628.00 ක නිවැරදි අගය සටහන් කරන ලදී. | |
| (ii) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව මූල්‍ය නොවන වත්කම් හි අවසාන ශේෂය රු.2,067,996,003 ක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.2,067,946,003 ක් විය. ඒ අනුව රු.50,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව මූල්‍ය නොවන වත්කම්හි අවසාන ශේෂය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ACA-6) හි අවසන් ශේෂය සැසඳෙන නමුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම අගය ඇතුලත් කිරීමේදී රු. 2,067,946,003 වශයෙන් සටහන් කර ඇති අතර ඉදිරි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එවැනි අතපසුවීම් සිදුනොවීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. | - එම - |
| (iii) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ රු.2,067,996,003 ක දේපළ පිරියත හා උපකරණ වටිනාකමට සමාන ප්‍රමාණයකින් දේපළ පිරියත හා උපකරණ සංචිතය වෙන් කළ යුතු වුවද එය රු.2,067,876,885 ක් විය. ඒ අනුව සංචිතය රු.119,119 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්හි අවසාන ශේෂය රු.50,000 ක් අඩුවෙන් සටහන්වීම හේතුවෙන් දේපල පිරියත හා උපකරණ සංචිතය වෙන් කිරීමේදී ද එම අගය අඩුවෙන් සටහන්වී ඇත. | -එම- |
| (iv) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/ 2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 10.1 ඡේදය යටතේ 2020 මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට අදාළ මාර්ගෝපදේශයෙහි 07(v) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් වටිනාකම ගණනය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ එම වටිනාකම දක්වා නොතිබුණි. | 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් ප්‍රකාශය ඇතුළත් කිරීම සිදු නොවුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**( ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සැලකීමේ දී පුද්ගල | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදි ප්‍රාග්ධන වැය විෂයන්හි මුදලින් දරන ලද වියදම් | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු රු. 70,869,949 ක මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් මෙන්ම රු.7,069,211 ක හැකියා වර්ධන වියදම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.77,939,160 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති අතර, ඉදිරියේදි මූලධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම් හා හැකියා වර්ධන වියදම් පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීමට නිසි කටයුතු සිදු කෙරේ. | |

**(ඇ) අග්‍රිම ශේෂය**

----------------

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------ | ------------------ |
| (i) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයේ අවසන් අග්‍රිම සාරාංශය (SA – 70) අනුව අග්‍රිම ලැබීම් වටිනාකම රු.144,899,618 ක් වුවද (ACA – 3) ආකෘතිය අනුව දක්වා තිබුණේ රු.145,226,080 කි. ඒ අනුව අග්‍රිම ලැබීම් රු.326,462 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ACA -3 ආකෘතියේ දක්වා ඇත්තේ භාණ්ඩාගාරයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අග්‍රිම ලැබීම් රු.144,670,000 හා වෙනත් මූලාශ්‍ර වලින් ලැබුණු එනම් ආදායම් නොවන ලැබීම් රු.481,487 ක්ද තැන්පතු ගිණුම් සඳහා ලැබුණු රු.62,167 ක් සහ මුද්දර ගාස්තු තැන්පතු රු.12,425 ක එකතුව වන රු.556,080 ලෙසයි.එසේම දෙපාර්තමේන්තුව මුදලින් දරණ ලද වියදම් වල එකතුව රු.145.226,080 ක් වන අතර, එය ACA - 3 ආකෘතියේ අග්‍රිම පියවීම ලෙස දක්වා ඇත. කෙසේ වුවත් මින් ඉදිරියට භාණ්ඩාගාර අවසන් අග්‍රිම සාරාංශය (SA/70) පරිදි අග්‍රිම ගිණුම පිළියෙල කිරීම සඳහා ගණකාධිකාරි සහ එහි කාර්යමණ්ඩලය වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයේ අවසන් ශේෂ පිරික්සුමේ (7002/409/20) වෙනත් මූලාශ්‍ර මඟින් අග්‍රිම ලැබීම් වටිනාකම රු.229,618 ක් වුවද (ACA - 3) ආකෘතියෙහි දක්වා තිබූ වටිනාකම රු.556,080 ක් විය. ඒ අනුව වෙනත් | -එම- | -එම- |

|  | | | |
|---|---|---|---|
| | මූලාශ්‍ර මගින් අග්‍රිම ලැබීම් රු.326,462 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| **(iii)** | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයේ අවසන් අග්‍රිම සාරාංශය (SA – 70) අනුව අග්‍රිම පියවීම් වටිනාකම රු.144,899,618 ක් වුවද (ACA – 3) ආකෘතියෙහි දක්වා තිබුණේ රු.145,226,080 කි. ඒ අනුව අග්‍රිම පියවීම රු. 326,462 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**(ඉ)** **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය/ මූල්‍ය පාලනය/ මෙහෙයුම් හා සඵලදායි අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාමේ අරමුණින් සෑම කාර්තුවකටම වතාවක් සියළුම අධ්‍යක්ෂකවරු, අණදෙන නිලධාරීන්, ප්‍රාදේශීය බලධාරීන් එක්ව අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කොට සාමූහික තීරණ ගනු ලබන අතර, එම් සාකච්ඡාවන් පිළිබඳව මෙතෙක් විගණකාධිපති දැනුවත් කිරීමට කටයුතු නොකර ඇති බැවින් මින් ඉදිරියට පැවැත්වෙන සාකච්ඡාවන් පිළිබඳව විගණකාධිපති දැනුවත් කිරීමට කටයුතු සිදු කෙරේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| | -------------------- | ----------------------- | -------------------- | --------------------- |
| **(i)** | 2018 අංක 19 දරන ජාතික විගණන පනත<br>-------------------- | | | |
| | 16 (2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමහ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2020 ඔක්තෝබර් මස 22 වන දිනැති අංක. DGCG/ADM/1 දරණ ලිපිය මගින් වාර්ෂික කාර්යය සාධන වාර්ථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) වෙත ඉදිරිපත් කර ඇත. මින් ඉදිරියට එහි පිටපතක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | මූල්‍ය ප්‍රකාශන සමහ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |
| **(ii)** | 2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත<br>-------------------- | | | |
| | 11 වන වගන්තිය | උපදේශක සභාවක් පත්කළ යුතු බවත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු | -එම- | පනතේ විධිවිධානයන් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුවත් ඒ අනුව කටයුතු කර ඇති බවට වූ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | | |
| | සමුද්‍රාසන්න සහ සමුද්‍රීය පරිසරය සංරක්ෂණය ආරක්ෂා කිරීමට සහාය වීම දෙපාර්තමේන්තුවේ කාර්ය හා කර්තව්‍ය වුවත් කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු හේතුවෙන් අදාල සහායයන් නිසි පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | -එම- | කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 බැංකු ගිණුම් මෙහෙයවීම

--------------------------

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව 2020 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු.42,443,982 ක් වන අතර එහි නිකුත් කර මාස 06 ක් ඉක්මවා බැංකුව වෙත ඉදිරිපත් නොවූ චෙක්පත් 10 ක වටිනාකම රු.253,378 ක් වී තිබුණි. | සැපයුම්කරුවන් වෙත බිල්පත් නිරවුල් කිරීමට අදාළ වූ සියළුම ප්‍රේෂණපත් ලියාපදිංචි තැපැල් මඟින් පමණක් ඉදිරිපත් කරනු ලබන අතර, ගෝලීය වසංගත තත්ත්වය හමුවේ බස්නාහිර පළාත තුහ තැපැල් කාර්යාල බොහෝ ප්‍රමාණයක් වසා තැබීම හේතුවෙන් ප්‍රේෂණපත් යැවීමේදී බොහෝ කාලයක් ගතවිය. එම හේතුන්මත බොහෝ ප්‍රේෂණපත්හි වලංගු කාලසීමාව ඉක්මවා ගොස් ඇති බැවින් නැවත දින දිර්ඝ කර ප්‍රේෂණපත් යැවීමට සිදුවිය. මේ හේතුවෙන් මාස 06 ඉක්මවූ බැංකුව වෙත ඉදිරිපත් නොවූ ප්‍රේෂණපත් පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | COVID - 19 වසංගත තත්ත්වය හමුවේ සැපයුම්කරුවන් මුහුණපා ඇති තත්ත්වය හමුවේ ප්‍රේෂණපත්හි කාලය දීර්ඝ කර දීමට සැලකිළිමත්වූ අතර, ඉදිරි මාස 03 ක කාලසීමාව ඇතුළතදී එම ප්‍රේෂණපත් නිසි පරිදි බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ. | |
| (ආ) | එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර චෙක්පත් 10 අතුරින් රු.170,773 ක් වටිනා චෙක්පත් 05 ක් 2021 පෙබරවාරි බැංකු සැසඳුම අනුවද තවදුරටත් ඉදිරිපත් වී නොතිබුණි. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 ප්‍රසම්පාදනයන්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවද විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබූ ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂයේ මුල් මාස 04 සඳහා පමණක් පිළියෙල කර තිබුණි. | ක්‍රියාවන් සම්බන්ධයෙන් ලේඛණය ඉතිරි මාස 08 සඳහා ඉදිරිපත් කිරීමට අපොහාසත් වූ බැවින්, මින් ඉදිරියට ඒසේ සිදු නොකිරීමට කටයුතු කෙරේ. | සම්පූර්ණ වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භක අවස්ථාවේ සිට අවසාන අවස්ථාව දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවන් සම්බන්ධයෙන් ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීමට අදාළ මූල්‍යමය තොරතුරු සහ එක් එක් ලංසු පිළිබඳ තොරතුරු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කළ යුතු වුවද Timber Plank මිලදී ගැනීම සහ Macrotech Layer අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රයේ බොහෝ කරුණු Timber Plank මිළදී ගැනීම සහ Macrotech Layer අළුත්වැඩියා කිරීම සම්බන්ධ ලිපි ගොණුවන්හි ඇතුලත් වුවද යම් යම් කරුණු ඇතුලත් නොවී ඇති බැවින් මින් ඉදිරියට ලංසු විවෘත කිරීම සඳහා යොදාගන්නා ආකෘතිපත්‍රය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. | - එම- |

## 3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික වශයෙන් වැදගත් කාලීන අවශ්‍යතාවයන් වූ උසස් පුහුණු පරිපාලන හා නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 102.36 ක් හා රු.මිලියන 55.40 ක් ලෙස පිරිවැය ඇස්තමේන්තුවක් 2016 වර්ෂයේදී සැලසුම් කර මූලික කටයුතු සඳහා රු.මිලියන 14 ක් වියදම් කර තිබුණි. විෂයගත ඉදිකිරීම් ව්‍යාපෘති ද්විත්වය මේ වන විට අතරමග අත්හිටවනු ලැබ තිබුණි. | 2020 වර්ෂය සඳහා අනුමත වූ අයවැය ජනවාරි සිට අප්‍රේල් මස දක්වා පමණක් වූ බැවින් එම කාලසීමාව සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර කාර්තු වශයෙන් සංශෝධිත වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් අයවැය ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මනා කළමණාකාරීත්වයකින් යුතුව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට අපහසු විය. 2017 වර්ෂයේ ඉදිකිරීම් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්වූ අතර, එයින් ගබඩා විෂයයන් ඇණවුම් කර රු.මිලියන 14.7 වටිනාකමකින් යුත් ගබඩා විෂයයන් වැය කර සිව් මහල් උසස් පුහුණු පරිපාලන ගොඩනැගිල්ලේහි අත්තිවාරම දමා ඇත. දැනට මෙම දෙපාර්තමේන්තු මූලස්ථානය තුළ රු.මිලියන 1.77 ක අමුද්‍රව්‍ය ඉතිරිව පවතින අතර තාවකාලිකව අත්හිටුවන ලද ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන ලෙස 2021 ජනවාරි මස 12 වන දිනැති | විෂයගත ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කර අවසාන කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අංක. අමප/20/1949/303/051 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලෙස දැනුම් දී ඇත. මෙම දෙපාර්තමේන්තු වෙත 2021 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන තුළින් එම ගොඩනැගිලි ද්විත්වයේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට නොහැකි බැවින්, අමතර ප්‍රතිපාදන ලබා දෙන ලෙස 2021 මාර්තු මස 01 වන දිනැති DGCG/LOG/3 දරණ අධ්‍යක්‍ෂ ජනරාල්, ශ්‍රීලංවෙආදෙගේ ලිපිය මඟින් ඉල්ලීමක් සිදු කර ඇත. එම අමතර ප්‍රතිපාදන ලද විගස එම ගොඩනැගිලි ද්විත්වයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර අදාල ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලද වටිනාකම රු.722,523,850 ක් වූ තහනම් මත්ද්‍රව්‍ය ශ්‍රී ලංකා පොලීසිය වෙත භාරදී තිබුණ ද එම භාරදීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය පිළිබඳව දැනට අප දෙපාර්තමේන්තුව මඟින් පසු විපරමක් සිදු නොකරන නමුත් ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කෙරේ. | අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය වෙනුවෙන් පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලද වටිනාකම රු.2,486,816,100 ක් වූ යාත්‍රා හා අනෙකුත් ද්‍රව්‍ය ශ්‍රී ලංකා ධීවර වරාය වෙත භාරදී තිබුණ ද එම භාරදීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලද යාත්‍රා පිළිබඳව ධීවර බෝට්ටු යොදා ගනිමින් සිදු කරනු ලබන නීති විරෝධී කටයුතු වර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති කාර්යයසාධන බලකා රැස්වීමේදී නිරන්තරයෙන් සාකච්ඡා කරනු ලබන අතර අත්අඩංගුවට ගත් යාත්‍රා සම්බන්ධව ගත් නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | -එම- |

විසින් අප දෙපාර්තමේන්තුව යෝජිත ක්‍රමවේදයට අනුව දැනුවත් කිරීම සිදු කෙරේ.

**4. මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය තුළ ජොෂ්ඨ මට්ටමේ තනතුරු දෙකක් විගණිත වාර්තාවේ දින දක්වාම පුරප්පාඩු වී තිබුණි | අනුමත කාර්යය මණ්ඩලය තුළ ජොෂ්ඨ මට්ටමේ තනතුරු දෙකක් වසර 08 ක් තිස්සේ පුරප්පාඩු වී නොමැත. | පුරප්පාඩු වී ඇති තනතුරු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ද්විතියික පදනම මත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය තුළ පිළිවෙළින් නිලධාරීන් හා නාවිකයින් 26 ක් 182 ක් එනම් සියයට 21 ක් හා 12 ක් පුරප්පාඩු වී තිබුණි. | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ද්විතියික පදනම මත අනුයුක්ත කාර්යය මණ්ඩලය තුළ පිළිවෙළින් නිලධාරීන් 99 ක් හා නාවිකයින් 1318 ක් පුරප්පාඩු නොව සම්පූර්ණ වී ඇති ලෙස නිවැරදි විය යුතු වේ. | -එම- |
| (ඇ) | ගිණුම් කාර්යාලය සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරීන් සංඛ්‍යාව තිදෙනෙක් වීම හේතුවෙන් රාජකාරී ඉටු කිරීමේදී එය දැඩි අපහසුතාවයක් වී තිබුණි. | ගිණුම් කාර්යාලය සඳහා දැනට අනුයුක්ත වී ඇත්තේ නාවිකයන් තිදෙනෙකු වුවත් ඉදිරියේදී තවත් නාවිකයෙකු අනුයුක්ත කිරීමට කටයුතු කෙරේ. | අවශ්‍ය අනුයුක්ත කිරීම් කඩිනම් කළ යුතුය. |
| (ඈ) | පුරප්පාඩු සංඛ්‍යාව වැඩිවීම ස්වාධීන ආයතනයක් ලෙස දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉදිරියේදී කාර්යක්ෂමව ඉටු කිරීමට බාධා වී තිබුණි. | 2021 අප්‍රේල් මස 29 දිනැති අංක ඩීජීසීජී/එල්ඕජී/10 දරන අධ්‍යක්ෂ ජනරාල්, ලිපිය මගින් වර්තමාන කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු සම්බන්ධව සවිස්තරාත්මකව තොරතුරු දක්වා ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පවතින පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |